කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

வளிமண்டலவியல் திணைக்களம்

DEPARTMENT OF METEOROLOGY

2020

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த சாத்திய அறிக்கை

Annual Performance Report

කාර්ය සාධන වාර්තාව
2020

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය- 304

2020 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය- 304

අන්තර්ගතය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 5

1.1 හැඳින්වීම 5

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු 5

1.3 ප්‍රධාන කාර්යයන් 6

1.4 සංවිධාන සටහන 7

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල 8

1.5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 8

1.5.2. **දෙපාර්තමේන්තුව යටතේ** පවතින ප්‍රාදේශීය කාර්යාල 10

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 10

1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 11

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 13

2.1 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකි කරන අංශයේ ප්‍රගතිය 13

2.2 පර්යේෂණ අංශය සහ දේශගුණ විපර්යාස අධ්‍යයන කේන්ද්‍රය 14

2.3. වර්ෂාපතන, දත්ත, දේශගුණ, උපකරණ අංශ හා බාහිර කාර්යාලවල ප්‍රගතිය 15

2.3.1. දත්ත අංශයේ ප්‍රගතිය 15

2.3.2 වර්ෂාපතන අංශයේ ප්‍රගතිය 15

2.3.3. දේශගුණ අංශයේ ප්‍රගතිය 16

2.3.4. උපකරණ අංශයේ ප්‍රගතිය 16

2.3.5 බාහිර කාර්යාල වල ප්‍රගතිය 16

2.4 අභියෝග 17

2.5 ඉදිරි ඉලක්ක 18

03 පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 20

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 20

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 21

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 22

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 23

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 23

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 23

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 24

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 24
04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක 25
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 25
05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය 26
5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු 26
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් 28
5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක 28
5.2.2. **තිරසර** සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග 31
06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 32
6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය (2020.12.31 දිනට කාර්ය මණ්ඩලය) 32
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය 32
6 .3 මානව සම්පත් සංවර්ධනය 33
07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 34
ඇමුණුම **01** **45**

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ විෂය පථය යටතේ පවත්නා පැරණිතම ආයතනයක් වන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි මූලාරම්භය පිළිබඳව සැලකීමේදී මුලින්ම මෙරට තුල විධිමත්ව කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කිරීම 1867 වසරේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ ආරම්භ විය. පසුව 1909 දී කාලගුණ විද්‍යාත්මක කටයුතු සඳහා කොළඹ නිරීක්ෂණාගාරය නමින් වෙනම අංශයක් වර්තමාන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල පිහිටුවීම සිදු විය. කාලගුණික සහ දේශගුණික සේවා ලබාදීමේ මූලික අරමුණ ඇතිව එම කොළඹ නිරීක්ෂණාගාරය 1948 වසරේදී ස්වාධීන දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදි. වර්තමානය වන විට කාලගුණ විද්‍යාව සහ දේශගුණ විද්‍යාව ආශ්‍රිත සේවා සැපයීමේ රජයේ ව්‍යවස්ථාපිත ආයතනය වශයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කරයි. කාලගුණ ව්‍යසන සහ සුනාමි පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් සඳහා බලය ලත් ජාතික ආයතනය වනුයේද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවයි.

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු

දැක්ම

තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක් උදෙසා කාලගුණය සහ දේශගුණය පිළිබඳ සේවාවන් සැපයන ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම බුද්ධි මධ්‍යස්ථානය වශයෙන් පැවතීම.

මෙහෙවර

ජාතික ශුභ සිද්ධියට සහ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වෙමින් රාජ්‍ය ආයතන වලට, පෞද්ගලික අංශයේ ආයතන වලට සහ මහජනයාට කාලගුණ විද්‍යාව, ගුවන් කාලගුණ විද්‍යාව, සමුද්‍ර කාලගුණ විද්‍යාව, ජල කාලගුණ විද්‍යාව, කෘෂි කාලගුණ විද්‍යාව, දේශගුණ විද්‍යාව සහ සීමිත වූ තාරකා විද්‍යාව පිළිබඳ සේවාවන් සැපයීම.

අරමුණු


- විවිධ ක්ෂේත්‍ර වලට අදාළව සිදුවන බලපෑම පාදක කරගත් ස්ථානය හා වේලාව වඩා නිරවද්‍ය වූ කාලගුණ අනාවැකි සේම කාලගුණ අනතුරු ඇඟවීම් සැපයීම.
- ඍතු අනාවැකිකරණය විශේෂයෙන්ම කෘෂිකර්මාන්තයට අදාළ වන සේ නිකුත් කර එම අනාවැකි නිතිපතා යාවත්කාලීන කිරීම.
- රජයේ දිගුකාලීන සංවර්ධන කටයුතු පහසුකර ගැනීම සඳහා එම සංවර්ධන කටයුතු නිසි පරිදි සැලසුම් කර ගැනීමට අවශ්‍ය දේශගුණික අනාවැකි වඩා විශ්වාසනීය තත්ත්වයකට ගෙන ඒම.

- දෙපාර්තමේන්තුවේ සියලු යටිතල පහසුකම් අන්තර්ජාතික තත්ත්වයට ගැලපෙන පරිදි නවීකරණය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- මහජනතාවට සහ කෘෂිකාර්මික. බලශක්ති, ධීවර, නාවික. රක්ෂණ සහ උනන්දුවක් දක්වන අනෙකුත් ක්ෂේත්‍රයන් සඳහා කාලගුණ විද්‍යාත්මක සහ දේශගුණ විද්‍යාත්මක සේවා සැපයීම.
- අයහපත් කාලගුණ තත්වයන් ද (සුලිසුළං, තද වැසි, අකුණු ගැසීම්, තද සුළං ඇතුළුව) සහ සුනාමි පිළිබඳව ද දැනුවත් කිරීම් සහ උපදෙස් ලබාදීම.
- ගුවන් සේවාවන්ට අදාළ කාලගුණ විද්‍යා සේවා සැපයීම.
- දේශගුණ විද්‍යාත්මක දත්ත පාදක පවත්වාගෙන යාම.
- ජාතික සංවර්ධනයට සහ පර්යේෂණ කටයුතු සඳහා කාලගුණ විද්‍යාත්මක, දේශගුණ විද්‍යාත්මක සේවා සහ දත්ත සැපයීම.
- කාලගුණ විද්‍යාව, දේශගුණ විද්‍යාව, දේශගුණික වෙනස්කම් සහ ආශ්‍රිත විෂයන් පිළිබඳ අධ්‍යයන සහ පර්යේෂණ වලට උනන්දු කරවීම.
- කාලගුණය, දේශගුණය සහ දේශගුණික වෙනස්කම් යන තේමාවන්ට අදාළ ක්ෂේත්‍රයන්හි මහජනතාව දැනුවත් කිරීමේ වැසටහන් සංවිධානය කිරීම සහ ඒවාට දායක වීම.
- පාසල් සිසුන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ තීරණ ගන්නන් ඇතුළත් උනන්දුව දක්වන කණ්ඩායම් සඳහා නියම කරන ලද තේමාවන්ට අදාළ ක්ෂේත්‍රයන්හි අධ්‍යාපනික, පුහුණු වැඩසටහන් සහ වැඩමුළු සංවිධානය කිරීම සහ ඒවාට දායක වීම.
- ප්‍රදර්ශන භාණ්ඩ සහ සම්පත් දායකයින් සැපයීමෙන් ප්‍රදර්ශන සඳහා දායක වීම.
- ඉල්ලීම් මත විශේෂිත කාලගුණ විද්‍යාත්මක සහ දේශගුණ විද්‍යාත්මක සේවා සැපයීම.
- සීමිත තාරකා විද්‍යාත්මක (හිරු, සඳු, ග්‍රහලෝක සහ උදම්) සහ භෞමික චුම්බකත්වය ආශ්‍රිත සේවා සැපයීම.

1.4 සංවිධාන සටහන



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල

1.5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

අනු අංකය	ප්‍රධාන අංශය	උප අංශය	වගකීම්
01	නිරීක්ෂණ ජාල හා උපකරණ	උපකරණ අංශය	සාම්ප්‍රදායික කාලගුණ විද්‍යා උපකරණ නඩත්තුව අළුත් වැඩියාව සහ ක්‍රමාංකනය, ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධතිය නඩත්තුව සහ ක්‍රමාංකනය,බාහිර ආයතන වලින් ලැබෙන ඉල්ලීම් අනුව කාලගුණ විද්‍යා උපකරණ නඩත්තු අළුත් වැඩියා සහ ක්‍රමාංකනය,වඩු සහ කාර්මික කාර්යයන් හා ප්‍රදර්ශන කටයුතු වලට සහය වීම
		විදුලි හා විද්‍යුත් නඩත්තු අංශය	විදුලි හා විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හා නඩත්තු කිරීම,ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධතිය සහ චන්ද්‍රිකා දත්ත ලබාගැනීමේ පද්ධතිය නඩත්තු කිරීම
		රේඩාර් / රේඩියෝසොන්ඩ් අංශය	ඉහළ වායුගෝල නිරීක්ෂණ, එම දත්ත සංරක්ෂණය, දෙපාර්තමේන්තුව නැරඹීමට පැමිණෙන අය සඳහා දැනුම්වත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම
		ප්‍රාදේශීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	සෑම පැය 3කට වරක්ම භූතල මට්ටමේ කාලගුණ විද්‍යා නිරීක්ෂණ ලබා ගැනීම. නිරන්තර කාලගුණ තත්ත්වය නිරීක්ෂණය ඉහළ වායුගෝලීය නිරීක්ෂණ සෑම පැය 06 කට වරක් ලබා ගැනීම. (ඉහළ වායුගෝලීය නිරීක්ෂණ මධ්‍යස්ථාන)
02	දත්ත සැකසුම් හා සංරක්ෂණ	දත්ත අංශය	අඛන්ඩව දත්ත සටහන් කෙරෙන උපකරණ වල දත්ත තත්ත්ව පාලනය හා සංරක්ෂණය
		දේශගුණ විද්‍යා අංශය	ප්‍රාදේශීය මධ්‍යස්ථාන සම්බන්ධීකරණය හා කළමනාකරණය, කාලගුණ විද්‍යා දත්ත තත්ත්ව පාලනය හා සංරක්ෂණය
		වර්ෂාපතන අංශය	සියලුම වර්ෂාපතන මධ්‍යස්ථාන

			සම්බන්ධීකරණය, සියලුම වර්ෂාපතන මධ්‍යස්ථාන අධීක්ෂණය, නව වර්ෂාපතන මධ්‍යස්ථාන පිහිටුවීම, වර්ෂාපතන මැනීම් සඳහා ස්වේච්ඡා නිරීක්ෂකයන් පුහුණු කිරීම, දත්ත තත්ත්ව පාලනය සහ සංරක්ෂණය, උපකරණ නඩත්තුව
		කෘෂි කාලගුණ විද්‍යා අංශය	කෘෂි කාලගුණ විද්‍යා ජාලය කලමනාකරණය සහ දත්ත තත්ත්ව පාලනය සහ සංරක්ෂණය
		පරිගණක අංශය	විද්‍යුත් ආකාරයෙන් දත්ත තත්ත්ව පාලනය සහ සංරක්ෂණය, දේශගුණ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම, බාහිර පාර්ශවයන් සඳහා දත්ත නිකුත් කිරීම, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය පවත්වාගෙන යාම සහ නවීකරණ කටයතු සිදු කිරීම
		පුස්තකාලය	පුස්තකාලය පවත්වාගෙන යාම
		ලේඛණාගාරය	දත්ත සහ ලේඛණ සංරක්ෂණය
03	පුරෝකථන හා තීරණ උපකාරක	ජාතික කාලගුණ විද්‍යා හා සුනාමි පූර්ව අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානය	කාලගුණ විද්‍යා දත්ත නැවත පිළියෙළ කර විශ්ලේෂණ කිරීම,කාලගුණ අනාවැකි නිකුත් කිරීම සහ සම්ප්‍රේෂණය, සුනාමි සහ කාලගුණ ව්‍යසන සම්බන්ධව ජාතික පූර්ව අනතුරු දැනුම්දීමේ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම
		සන්නිවේදන අංශය	කාලගුණ විද්‍යා දත්ත /නිරීක්ෂණ හුව මාරු කර ගැනීම, කාලගුණ විද්‍යා අනාවැකි හා අනතුරු ඇඟවීම් සම්ප්‍රේශණය
		ගුවන් තොටුපළ කාලගුණ විද්‍යා කාර්යාල	ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) සහ ලෝක කාලගුණ විද්‍යා සංවිධානය (WMO) ට අනුකූලව ගගන කාලගුණ විද්‍යාව සඳහා අවශ්‍ය දත්ත/තොරතුරු ලබා දීම
	පර්යේෂණ පුහුණු	පර්යේෂණ අංශය	කාලගුණ විද්‍යා සහ දේශගුණ විද්‍යා

04	හා සංවර්ධන		පර්යේෂණ පැවැත්වීම
		පුහුණු අංශය	පුහුණු කිරීම් සහ දෙපාර්තමේන්තු විභාග පැවැත්වීම
		දේශගුණ වෙනස්වීම් අධ්‍යයන කේන්ද්‍රය	දේශගුණ වෙනස්වීම් වලට අදාල කටයුතු පවත්වාගෙන යාම
05	පාලන හා මූල්‍ය	ආයතන අංශය	කාර්ය මණ්ඩලය සම්බන්ධ ආයතනික කටයුතු
		මූල්‍ය අංශය	මූල්‍ය කටයුතු
		ප්‍රසම්පාදන අංශය	ප්‍රසම්පාදන, ගබඩා කිරීම්, බෙදාහැරීම්
		විශේෂ ප්‍රසම්පාදන අංශය	විදේශ වලින් කරන මිළදී ගැනීම් කටයුතු
		ප්‍රවාහන අංශය	වාහන නඩත්තුව හා ප්‍රවාහන කටයුතු
		ඉදිකිරීම් අංශය	දෙපාර්තමේන්තුවට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු සම්බන්ධව සම්බන්ධීකරණය

1.5.2. දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල

කටුනායක, මත්තල, රත්මලාන, යාපනය, අනුරාධපුරය, බදුල්ල, බණ්ඩාරවෙල, මඩකලපුව, හම්බන්තොට, කටුගස්තොට, කුරුණෑගල, මහඉලුප්පල්ලම, මන්නාරම, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පොතුවිල්, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, ගාල්ල, වවුනියාව,මුලතිව්.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

මහ භාණ්ඩාගාරයේ ගිණුමෙන් ලැබෙන මුදලින් නඩත්තු වේ.අරමුදල් නොමැත.

1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

වෙනත් රාජ්‍යයන් / සංවර්ධන පාර්ශවකරුවන් හා වෙනත් විදේශ ආයතන වෙතින් 2020 වර්ෂයේ විදේශ ප්‍රදාන පිළිබඳ විස්තර

විදේශ ප්‍රදාන ලබාදුන් රට හෝ ආයතනය	විදේශ ප්‍රදාන ගිවිසුම් අංකය	විස්තරය (ප්‍රදානය ලබාදුන් හේතුව)	මුදල්, භාණ්ඩ හෝ සෘජු ගෙවීමක්ද යනවග	විදේශ ප්‍රදාන වටිනාකම		ව්‍යාපෘති කාල සීමාව
				රුපියල්	විදේශ මුදල්	
World Bank	CRIP (project)	ECMWF data license until 30 June 2021	අදාල ආයතනයට ECMWF-සෘජු ගෙවීමක්		EUR 42,000.00	වසරක්
		නොර්වේ කාලගුණ පුහුණුව MET Norway Training	සෘජු ගෙවීමක් නොර්වේ / ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ගුවන් ටිකට්පත් සහ ඉදුම් හිටුම් සඳහා		US$180,000.00	වසරක්
		දෙපාර්තමේන්තු නවීකරණ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය දේශීය උපදේශන සහාය ලබාදීම	සෘජු ගෙවීමක්	800,000.00		මාස 3 ක් සඳහා

UNDP	GCF-CRIWMP	අන්තර් ජාලය හරහා රැස්වීම් පැවැත්වීම සඳහා ZOOM සඳහා බලපත්‍ර ගාස්තු ගෙවා ලබා දෙන ලදී	සෘජු ගෙවීමක්			වසරක්
		WEB GIS වෙබ් අඩවිය සහ දුරකථන (Mobile APP) දෘඩාංගය ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කරන ලදී.	සෘජු ගෙවීමක්			

- ECMWF – European Center for Medium Range Weather Forecasting
- UNDP - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
- DOM - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- World Bank - ලෝක බැංකුව
- GCF – Green Climate Fund
- AWS - ස්වයංක්‍රිය කාලගුණ දත්ත පද්ධති GIS – Geo Information System
- CRIP-Climate Resilience Improvement Project

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ,ජයග්‍රහන,අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකි කරන අංශයේ ප්‍රගතිය

1. ඍතුමය සහ දිගුකාලීන අනාවැකි නිවැරදිව සහ ඵලදායි ආකාරයෙන් ඉදිරිපත් කිරීමෙන් අස්වැන්න හානිය අවම කිරීමට හැකිවීම
   - භාෂා ත්‍රිත්වයෙන් මාසිකව දේශගුණ අනාවැකි නිකුත් කිරීමට කටයුතු කරන ලදී.
   - වවුනියාව, අනුරාධපුර, ත්‍රිකුණාමලය, පොලොන්නරුව, මන්නාරම, පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්ක වෙත ගොස් 2020 මහ කන්නය සඳහා වැසි තත්වය පිළිබඳ අනාවැකි නිවැරදිව සහ නියමිත වෙලාවට අදාල රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් (කෘෂිකර්මයට සහ ජල කළමනාකරණයට අදාල) දැනුවත් කිරීමෙන් අස්වනු සහ වගා හානිය අවම කිරීමට හැකිවීම. මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP -CRIWMP) යටතේ අනුග්‍රහය දක්වන ලදී.
   - මෙම දිස්ත්‍රික්ක වල අදාල පාර්ශවකරුවන් සමග කාලගුණ තත්වය පිළිබඳ මාසිකව අන්තර්ජාලය හරහා සාකච්ජා කිරීම ආරම්භ කිරීමෙන් වඩා පලදායි සේවාවක් ලබාදීම ආරම්භ කරන ලදී. එහි සාර්ථකත්වය හේතුවෙන් එය සතිපතා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමෙන් දැනට එම සාකච්ජාව සතිපතා සවිස්තරව රූපමය ආකාරයෙන් ඉදිරිපත් කරයි.
   - මෝසම් කතිකාවතේ පාර්ශවකරුවන්ගේ ‘ඉදිරි දින කිහිපය සඳහා සවිස්තරව කාලගුණ අනාවැකි’’ වලට තිබූ ඉල්ලීම අනුව දිනපතා මෙම රූපමය ආකාරයෙන් අනාවැකි ප්‍රධාන පාර්ශවකරුවන් වෙත යැවීම සිදු කරන ලදී. ඒ මඟින්, ඉදිරි දින වල කාලගුණ තත්ත්වය පිළිබඳ අදහසක් ගැනීමට සහ අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග (ආපදා සඳහා පෙර සුදානමක් සහ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියා) ගැනීමට පිටිවහලක් විය. දැනට මෙම අනාවැකි වැඩි දියුණු කරමින් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මඟින් මහජනතාව වෙත ලබා දෙයි.

2. මහජනතාවට මෙන්ම අවශ්‍ය පාර්ශ්වකරුවන්ට (ස්ථානියව (area specific) සහ තත්‍ය කාලයෙන් (real time) දත්ත ලබාගැනීමට) වඩා පලදායි ආකාරයෙන් කාලගුණ සහ දේශගුණ තොරතුරු ලබා දීමට WEB GIS වෙබ් අඩවිය සහ දුරකථන දෘඩාංගය (Mobile APP) ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කරන ලදී.
3. දීර්ඝ කාලයක සිට පැවති අවශ්‍යතාවයක් වූ ගණිතමය ආකෘති වැඩි දියුණු කිරීමට, පර්යේෂණ සහ කාලගුණ දත්ත පරිශීලනය සඳහා අවශ්‍ය පරිගණක සාක්ෂරතාවය ඉහල නැංවීම සඳහා අවශ්‍ය දැනුම වැඩිකරලීම සඳහා අදාල නිලධාරීනට LINUX /R පිළිබඳ පුහුණුවක් ලබාදීම ආරම්භ කරන ලදී.

2.2 පර්යේෂණ අංශය සහ දේශගුණ විපර්යාස අධ්‍යයන කේන්ද්‍රය

2020 වර්ෂයේ පහත සඳහන් ක්ෂේත්‍රයන් ඔස්සේ පර්යේෂණ කටයුතු සිදු කිරීම.

- ලංකාවේ නියහ තත්ව නිරීක්ෂණය වැඩි දියුණු කිරීම සහ නියඟය අනාවැකිකරණය ආරම්භ කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව පර්යේෂණ ආරම්භ කිරීම.
- මෘදු, මධ්‍යම සහ දුර්වල (Mild, weak, moderate) El Nino සහ La Nina තත්ත්ව වලදී ලංකාවේ වර්ෂාපතන රටාවේ වෙනස් වීම් අධ්‍යනය.
- ශ්‍රී ලංකාවේ මාසික සහ සෘතුමය වර්ෂාපතනය සඳහා උතුරු අත්ලාන්තික් දෝලනයේ (North Atlantic Oscillation) බලපෑම අධ්‍යයනය.
- ගෝලීය දේශගුණික මොඩලයන්, මඟින් ලබාදෙන ලද ත්‍රෛමාසික නිරීක්ෂිත වර්ෂාපතන හා සංසඳනය කරමින්, ශ්‍රී ලංකාවට එහි ඇති වලංගු භාවය පරීක්ෂා කිරීම.
- අර්ධ, දිගුකාලින අනාවැකිකරණය ඒකාබද්ධ කිරීම තුලින් දේශගුණික සේවාව වැඩි දියුණු කිරීම: සිද්ධි අධ්‍යනය 2020 නිරිතදිග මෝසම.
- 2020 සැප්තැම්බර 1 වෙනි දින වාර්තාවූ කෙටි කාලීන තද වැසි තත්වයට හේතුවූ කාලගුණ සංසිද්ධි පිළිබඳ පර්යේෂණය.

පර්යේෂණ ප්‍රකාශන

- Center For Science and Technology of the Non- Aligned and Other developing Countries (NAM S&T Center) ඡ'නලය සඳහා 2020 සැප්තැම්බර 1 වෙනි දින වාර්තාවූ කෙටි කාලීන තද වැසි තත්වයට හේතුවූ කාලගුණ සංසිද්ධි පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් ලබාදීම.
- 2016 මැයි 15 ලංකාවට ඇතිවූ ගංවතුර සහ නායයාමට හේතුවූ ROANU සුළි කුණාටුව පිළිබඳ International Symposium on Multi Hazard Early Warning and Disaster Risk Reduction සඳහා පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
- පර්යේෂණ සහ සංවර්ධන අංශය සහ දේශගුණ විපර්යාස අධ්‍යන කේන්ද්‍රය මඟින් සිදු කරනු ලබන නිත්‍ය රාජකාරී.

නියං තත්ත්වය නිරීක්ෂණ

- නියං තත්ත්වය නිරීක්ෂණ පත්‍රිකාව - Standardized Precipitation Index භාවිතයෙන් නියං තත්ත්ව නිරීක්ෂණය සහ සිතියම් ගත කිරීම. මාසික වර්ෂාපතන දත්ත භාවිතයෙන් පිළිවෙලින් මාස 1,2,3,4,5,6,9 සහ12 යන කාල රාමු සඳහා නියං තත්ත්ව නිරීක්ෂණය කර එම කාල රාමු සඳහා නියං තත්වය සිතියම් ගත කිරීම.

- ලංකාවේ නියඟ තත්ත්ව නිරීක්ෂණය වැඩි දියුණු කිරීම සහ නියඟය අනාවැකිකරණය ආරම්භ කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව පර්යේෂණ ආරම්භ කිරීම.

දිගු කාලීන අනාවැකි ආශ්‍රිත ක්‍රියාකාරකම්

- CPT, FOCUS, CLICK මෘදුකාංග සහ ගෝලීය දේශගුණ ආකෘති සිතියම් භාවිතයෙන් මාසික සහ ත්‍රෛමාසික වර්ෂාපතන හා උෂ්ණත්ව අනාවැකි නිර්මාණය.
- කාලගුණික මධ්‍යස්ථානයන්හි නිරීක්ෂිත කාලගුණික දත්ත භාවිතයෙන් මාසික වර්ෂාපතන අනාවැකි සත්‍යාපනය කිරීම.
- දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ (IPCC) දේශීය කේන්ද්‍රය ලෙස දේශගුණ විපර්යාස අධ්‍යයන කේන්ද්‍රය මඟින් සිදු කරන ලද ක්‍රියාකාරකම්.
- දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC) මඟින් ප්‍රකාශයට පත් කිරීමට නියමිත පහත විශේෂ වාර්ථාවන්හි දේශීය විමර්ශන පිළිබඳව කටයුතු කිරීම.
  — ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා වන දේශගුණික විපර්යාස හා භූමිය සාරාංශ වාර්ථාවේ අවසන් කෙටුම්පත

2.3. වර්ෂාපතන, දත්ත, දේශගුණ, උපකරණ අංශ හා බාහිර කාර්යාලවල ප්‍රගතිය

2.3.1. දත්ත අංශයේ ප්‍රගතිය

- අඛන්ඩව දත්ත සටහන් කෙරෙන උපකරණවල (උෂ්ණත්වමාන ප්‍රස්ථාර, ආර්ද්‍රතාමාන ප්‍රස්ථාර, වර්ෂාපතන ප්‍රස්ථාර, පීඩන ප්‍රස්ථාර හා සූර්ය දීප්ත කාඩපත්) දත්ත තත්ත්ව පාලනය හා සංරක්ෂණය
- කාලගුණ විද්‍යා කාර්යාල 23 ක සුළඟේ වේගය හා දිශාව මාසිකව ගණනය කිරීම,කාලගුණ විද්‍යා කාර්යාල 10 ක සූර්ය දීප්ත පැය ගණන පරීක්ෂා කිරීම හා සංරක්ෂණය.
- බාහිර පාර්ශවයන් සඳහා දත්ත අලවියෙන් රු.126,560.00ක ආදායමක් 2020 වසරේදි ලබා ඇත.

2.3.2 වර්ෂාපතන අංශයේ ප්‍රගතිය

- වර්ෂාපතන දත්ත ලබාගැනීම සඳහා දිවයින පුරා ස්ථාපනය කර ඇති වර්ෂාමාන ජාලය මධ්‍යස්ථාන 555 කින් සමන්විත වන අතර ඉන් මධ්‍යස්ථාන 510 කට වැඩි සංඛ්‍යාවකින් වසර පුරාම දත්ත ලබා ගනී. මෙම මධ්‍යස්ථාන රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන හා ස්වේච්ඡා නිරීක්ෂකයන්ගේ සහයෝගය ඇතිව පවත්වාගෙන යනු ලැබේ.
- 2020 වසර තුළ වර්ෂාමාන මධ්‍යස්ථාන 01 ක් නැවත පිහිටුවන ලදි. 2020 වසර තුළ වර්ෂාමාන මධ්‍යස්ථාන 53ක් අධීක්ෂණය කර එහි ස්වේච්ඡා නිරීක්ෂකයින් 53 දෙනෙකුහට නිවැරදිව මිනුම් කටයුතු කිරීමට පුහුණුවක් ලබාදෙන ලදි.

- වර්ෂාමාන දත්ත ලබා ගැනීමේදී හානිවූ වර්ෂාමාන සඳහා නව වර්ෂාමාන 14ක් හා හානිවූ මිණුම්සරා සඳහා නව මිණුම්සරා 13ක් මෙම වර්ෂය තුළදී නිකුත් කර ඇත.

2.3.3. දේශගුණ අංශයේ ප්‍රගතිය

- සූර්යයා හා චන්ද්‍රයා උදාවීම, බැසීම හා පහන් දැල්වෙන වේලාව තීරණය කිරීම, ශ්‍රී ලංකාවේ එක් එක් ස්ථානවලට සූර්යයා මුදුන්වීම, තාරකාවන්ගේ දෘශ්‍යතාවය, නව සඳු දැකීම, සඳුගේ කලාවන් ග්‍රහණයන්, රාමසාන් උදාවීම හා නිමාවීම පිළිබඳ තත්ත්වයන් ගණනය කිරීම මෙන්ම අදාල ආයතන වෙත තොරතුරු ලබාදීම මෙම අංශයේ ප්‍රධාන වශයෙන් සිදුකළ කාර්යන් වේ.
- පොහොය හා රජයේ නිවාඩු දින කමිටුවේ සමාජිකයකු ලෙස ද මෙම අංශයේ සහය ලබා දෙයි.
- මෙම අංශයෙන් දත්ත බාහිර පුද්ගලයන් වෙත ලබා දීමෙන් රු.187,324.00ක් අදායමක් ලබා ඇත.

2.3.4. උපකරණ අංශයේ ප්‍රගතිය

- 2020 වසරේදී සාම්ප්‍රදායික උපකරණ 134ක් හා ඉලෙක්ට්‍රොනික උපකරණ 07ක් ක්‍රමාංකනය කර ඇත. සාම්ප්‍රදායික උපකරණ 182ක් හා ඉලෙක්ට්‍රොනික උපකරණ 03ක් නිකුත් කර ඇති අතර, ක්‍රමාංකන සහතික හා පරිවර්තී වගු 113ක් නිකුත් කර ඇත.
- පාසල් හා බාහිර ආයතනවල අධ්‍යාපනික ප්‍රදර්ශන 7ක් පවත්වා ඇත.
- කාර්මික අංශය මඟින් උපකරණ 37 අළුත්වැඩියා කර ඇති අතර, වඩු වැඩ අංශය මඟින් ලී අධාරක හා ස්ටිවන්සන් ආවරණ 06 ක් අළුත් වැඩියා කර ,09ක් අලුතින් නිෂපාදනය කර ඇත.

2.3.5 බාහිර කාර්යාල වල ප්‍රගතිය

- ද්වි පුද්ගල කාර්යාලයක්ව පැවැති කුරුණෑගල කාර්යාලය සිව් පුද්ගල කාර්යාලයක් බවට 2020.02.01 දින පත්කරන ලදී.
- ද්වි පුද්ගල කාර්යාල 8ක් හා සිව් පුද්ගල කාර්යාල 09ක් ද වේ. ඉහල වායු නිරීක්ෂණ කාර්යාල 03 ක් පංච පුද්ගල කාර්යාල ලෙස ක්‍රියා කරයි. ගගන කාලගුණ විද්‍යා කාර්යාල 3 ක් පවතී. 2020 වර්ෂය තුල කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුව තිබූ භූතල නිරීක්ෂන මධ්‍යස්ථාන ජාලය ඔස්සේ වර්ෂාපතනය, පීඩනය, උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, සුළඟ, දෘශ්‍යතාවය, වලාකුළු වර්ග හා ප්‍රමාණ ඇතුළුව භූතල නිරීක්ෂණ 58,502 ක් සිදුකර ඇත.
- මෙම වසරේදී කාර්යාල 5 ක් අධීක්ෂණ කළ අතර, නුවරඑළිය සංචාරක බංගලාව, බදුල්ල නිල නිවස හා නුවරඑළිය කාර්යාලය අළුත් වැඩියා කටයුතු සිදුකරන ලදී.

2.4 අභියෝග

- මෙම 2020 වසරේ ඉලක්ක සපුරා ගැනීම සඳහා කොවිඩ් 19 සැලකියයුතු බාධාවක් විය.
- අදාල සුදුසුකම්ලත් නිලධාරීන් ප්‍රමාණවත් අයුරින් නොසිටීම විශාල අභියෝගයකි.
- WEB GIS වෙබ් අඩවිය සහ දුරකථන දෘඩාංගය (Mobile APP) ස්ථාපිත කිරීමට අවශ්‍ය server එකක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙය අවසන් කිරීමට තවම නොහැකි වී ඇත.
- කාලගුණ විද්‍යාව යනු දිනපතා යාවත්කාලීන වන කාලගුණික ක්‍රියාවලීන් සහ පුරෝකථනය කෙරෙහි අවධානය යොමු කරන වායුගෝලය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයයි. එම සිදුවීම් පෘථිවි වායුගෝලයේ පවතින විචල්‍යයන්ගෙන් බැඳී ඇත. ඒවා නම් උෂ්ණත්වය, පීඩනය, ජල වාෂ්ප සහ එක් එක් විචල්‍යයේ ප්‍රමිතීන් සහ අන්තර්ක්‍රියා සහ ඒවා කාලයත් සමඟ වෙනස් වන ආකාරයයි.
- පෘථිවියේ නිරීක්ෂණය කරන ලද කාලගුණ සංසිද්ධීන් වලින් වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ නිවර්තන කලාපයේ වන අතර බොහෝ ඒවා ඉතා ඉක්මනින් වෙනස් වන සුළුය. මෙම කාලගුණ පද්ධතීන් පිළිබඳ නිවැරදිව අනාවැකි පැවසීම මෙම නිවර්තන කලාපයේ රට වලට පවතින ප්‍රධාන අභියෝගයකි. ශ්‍රී ලංකාව ද නිවර්තන කලාපය තුල පිහිටීම හේතුවෙන් කාලගුණ සහ දේශගුණ අනාවැකිකරණය සාපේක්ෂව මධ්‍යම දේශාංශ වල පිහිටි රටවලට වඩා සංකීර්ණ වන අතර අභියෝගාත්මක කාර්යයකි.
- සාපේක්ෂව කාලගුණ විද්‍යාව දියුණු රටවල ප්‍රධාන සන්ධිස්ථානය ලෙස දක්නට ඇත්තේ පරිගණක ආකෘති එනම් සංඛ්‍යාත්මක කාලගුණ අනාවැකි පිළිබඳ වැඩි අවධානය සහ ඒ පිළිබඳ ආයෝජනය වැඩි කිරීමෙනි. මේ විෂය සම්බන්ධයෙන් දැනට දියුණු සංවර්ධිත රටවල පවතින තාක්ෂනය දෙසට ලඟා වීමට ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට දිගු ගමනක් යා යුතුව ඇත. ප්‍රමාණවත් තරම් සුදුසුකම් සහිත මානව සම්පත් නොමැතිවීමද තවත් දෙපාර්තමේන්තුව අභිමුව ඇති අභියෝගයකි. කාලගුණ අනාවැකි කරනයට අත්‍යවශ්‍ය සාධකය වන වායුගෝලීය නිරීක්ෂණ ජාලය ශක්තිමත් කිරීමද වඩාත් නිවැරදිව පුරෝකථනය කිරීමට අත්‍යවශ්‍ය කාරණයකි. පවත්නා දේශගුණික විපර්යාස නිසා කාලගුණ දේශගුණ අනාවැකි කීම වඩ වඩාත් අපහසු වෙමින් යන පසුබිමක අදාල නව අධ්‍යයන/ පර්යේෂණ කටයුතු කිරීමද අනිවාර්යය වේ.
- ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම නිසා සිදු වන දේශගුණ විපර්යාස මිනිසා ගේ පැවැත්මට ඇති ප්‍රධාන අභියෝගය ලෙස මේ වන විට හඳුනාගෙන තිබේ. දේශගුණ ක්‍රියාවලිය සංකීර්ණ, එකිනෙක සමග අන්තර් ක්‍රියා කරන, එකිනෙක සමග සම්බන්ධතාවක් ඇති, වායුගෝලය, ගොඩබිම, අයිස් හා හිම, සාගර හා අනෙකුත් ජල පද්ධතිවලින් සමන්විත වූවක් වන අතර එම දේශගුණ පද්ධති සඳහා අවශ්‍ය ශක්තිය සූර්ය විකිරණ මඟින් ලබා දේ. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍යය මණ්ඩලය (Inter-Governmental Panel on Climate Change - IPCC) විසින් නිකුත් කරන ලද නවතම වාර්තාවලට අනුව ආන්තික කාලගුණික තත්වයන් එනම්

අධික උණුසුම් තත්වයන්, ආන්තික වර්ෂාපතනයන් මඟින් ඇති වන ක්ෂණික ජල ගැලීම්, නාය යෑම් සහ දිගුකාලීන නියං තත්ත්වයන් වල වාරගණන, තීව්‍රතාවය, කාලපරාස වල වැඩිවීමක් පසුගිය දශක කිහිපය තුල අත්දැක ඇති අතර අනාගතදීද මෙවැනි තත්ත්ව වල වර්ධනයේ ඉහළ යාම අපේක්ෂා කෙරෙන අතර මෙමඟින් දිගුකාලීන බලපාන සමාජ ආර්ථික හානි ඇතිවිය හැක ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාස නිසා ඇති වන අහිතකර බලපෑම්වලට මුහුණ දීමට දීමට හැකි වන පරිදි රට තුළ දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අනිවාර්යයෙන් සිදු කළ යුතු ව ඇත. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍යය මණ්ඩලයේ දේශීය කේන්ද්‍රය වන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් දේශගුණ විපර්යාස වල බලපෑම සහ දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීම සඳහා ගෝලීය දේශගුණික ආකෘති වල දේශගුණ විපර්යාස පුරෝකථන දත්ත ප්‍රාදේශීයව සවිස්තරාත්මක ලෙස අවපරිමණනය කිරීම, දේශගුණ විපර්යාස බලපෑම් පිලිබඳ පර්යේෂණ කිරීම, පර්යේෂණ සඳහා අවශ්‍ය දත්ත සැපයීම, දේශගුණ විපර්යාස පිළිබඳ නවතම සොයා ගැනීම් පිලිබඳ දැනුමින් සවිබල ගැන්වීම සිදු කරණු ලැබේ.

- දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය මඟින් හඳුන්වාදී ඇති නව සමාජ ආර්ථික සහාග මාර්ග සෙනාරිය (Shared Socioeconomic Pathways (SSPs) scenarios) යටතේ ගෝලීය දේශගුණික මොඩලයන්හි දේශගුණික පුරෝකථන දත්තයන් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය මට්ටමින් සවිස්තරාත්මක අවපරිමානගත කිරීම සහ ඒවා විශ්ලේෂනය කරමින් දේශගුණික සංවේදී ක්ෂේත්‍ර සඳහා අනාගතයේ අනතුරට භාජනය විමේ හැකියාව පිළිබඳ ඇගයීම් සකස් කිරීම, පුරෝකථන දත්ත දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය විමේ හැකියාව අධ්‍යනය.

2.5 ඉදිරි ඉලක්ක

- **දත්ත සන්නිවේදන ජාලය නවීකරණය කිරීම**

  දිවයින පුරා විසිරි පවතින ප්‍රාදේශීය විද්‍යා කාලගුණ කාර්යාල මඟින් පැය 3 න් 3ට නිරීක්ෂණය කරන කාලගුණ දත්ත දැනට කොළඹ කාලගුණ විද්‍යා කාර්යාලයට ලබා ගනු ලබන්නේ දුරකතන හරහාය. පසුව මෙම දත්ත පරිගණක ගත කරනු ලබන්නේ ද අතිනි. එබැවින් මේ සඳහා අධික පිරිවැයක් සහ කාලය මෙන්ම මිනිස් ශ්‍රමයද වැයවේ. මෙම දත්ත ලොව පුරා සංනිවේදනය වන අතර ඉතා වැදගත් වේ. මෙම දත්ත කාර්යක්ෂම ලබා ගැනීමට සහ සංරක්ෂණය ඉතා අත්‍යවශ්‍ය කාර්යයකි. මේ සඳහා අන්තර් ජාලය හරහා දත්ත සන්නිවේදන ජාලයක් සැකසීමට අවශ්‍ය පරිගණක සහ අනෙකුත් උපාංග ලෝක අහාර වැඩ සටහන (WFP) අනුග්‍රහයෙන් ලබා දීමට කටයුතු සිදුවෙමින් පවතී. 2021 ජුලි මස සිට මෙය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවේ.

- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම**

  කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරනය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යයංශය යටතේ "" දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ බහු-අදියර ක්‍රමලේඛ ප්‍රවේශය""(CresMPA) ව්‍යාපෘතිය යටතේ නියමිතව පවතී. මෙමඟින් කාලගුණ විද්‍යා නිරීක්ෂණ ජාලය වැඩිදියුණු කිරීම, අදාල මානව සම්පත් වැඩි දියුණු කිරීම, මෙන්ම අනාවැකි කරනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික උපාංග සහ යටිතල පහසුකම් ලබා දීම ප්‍රධාන අරමුණ වේ. මේ පිළිබඳ මූලික වැඩ කටයුතු සිදු වෙමින් පවතී.

- **පුත්තලම හා පොතුවිල් රේඩාර් පද්ධති ස්ථාපිත කිරීම**

  ජපාන රජයේ ආධාර මත දෙපාර්තමේන්තුවට ඩෝප්ලර් රේඩාර් පද්ධති දෙකක් ප්‍රධානය කිරීමට JICA ආයතනය කටයුතු කරමින් පවතී. මෙමඟින් තද වැසි සහ තද සුළං පිළිබඳ නිරවද්‍ය තාවය ඉහල අනතුරු ඇගවීමක් කිරීමේ හැකියාව ලැබේ.

- දේශගුණික විපර්යාස සහ විචලනය, දේශගුණික සංවේදී ක්ෂේත්‍ර එනම් කෘෂිකර්මන්තය, ජල කළමනාකරණය, ආපදා කළමනාකරණය, බලශක්ති සහ සෞඛ්‍ය ක්ෂේත්‍ර වල ක්‍රියකාරකම් කෙරෙහි දැඩි පීඩනයක් ඇති කරන බැවින් දේශගුණික තොරතුරු භාවිතා කරමින් දේශගුණික විපර්යාස සහ විචලනය හේතුවන් ඇතිවන අවබලපෑම් අවම කිරීම පිළිබඳ දැඩි අවධානයක් යොමුවී ඇත. දේශගුණික සේවාව නව්‍යකරණය කරමින් දේශගුණික සංවේදී ක්ෂේත්‍ර සඳහා තීරණ ගැනීමට පහසු අයුරින් දේශගුණික සේවාව වැඩි දියුණු කිරීම, දේශගුණික විපර්යාස සහ විචලනය හේතුවන් ඇතිවන අභියෝග ජයගෙන තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟාවීමට අත්‍යාවශ්‍ය වේ.

A K Karunanayake.

අධ්‍යක්ෂ ජනරාල්

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

A.K. Karunanayake
Director General
Department of Meteorology
383, Bauddhaloka Mawatha,
Colombo 07.

03 පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එස්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2020		2020	2019
	ආදායම් ලැබීම්		
	බදු නොවන ආදායම් හා වෙනත්	-	-
	මුළු ආදායම් ලැබීම් (අ)	-	-
	ආදායම් නොවන ලැබීම්		
	භාණ්ඩාගාර අයිමි	307,508,525.00	296,037,876.92
	තැන්පතු	841,911.62	330,946,664.82
	අත්තිකාරම් ගිණුම්	9,956,153.10	10,347,551.88
	වෙනත් ලැබීම්	20,703,444.29	30,339,005.42
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)	**339,010,034.01**	**667,671,099.04**
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)	**339,010,034.01**	**667,671,099.04**
	අඩුකළා : වියදම්		
	පුනරාවර්තන වියදම්		
254,132,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	247,734,165.21	240,827,685.80
58,135,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	49,371,278.63	49,709,440.71
12,163,000	සභනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	11,847,408.78	9,398,804.94
-	වෙනත් පුනරාවර්තන වියදම්	-	9,650.00
324,430,000	මුළු පුනරාවර්තන වියදම් (ඇ)	**308,952,852.62**	**299,935,931.45**
	මූලධන වියදම්		
9,649,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	8,628,459.79	988,521.16
27,861,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	21,203,481.94	14,795,277.41
1,372,000	තැකියා වර්ධනය	627,192.40	6,715,652.06
2,278,000	වෙනත් මූලධන වියදම්	325,553.20	9,325,262.40
41,160,000	මුළු මූලධන වියදම් (ඉ)	**30,784,687.33**	**31,824,713.03**
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)	**8,646,671.37**	**347,337,300**
	තැන්පතු ගෙවීම්	4,699,382.37	335,744,120.12
	අත්තිකාරම් ගෙවීම්	3,947,289.00	11,593,180.00
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)	**348,384,211.32**	**679,097,944.60**
365,590,000	2020 දෙසැම්බර් 31 දිනට අයිමි ශේෂය ඌ = (ඇ-උ)	**(9,374,177.31)**	**(11,426,845.56)**

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	තක්ෂ 2020 රු.	2019 රු.
මූල්‍ය නොවන වත්කම්		
දේපළ, පිරියත හා උපකරණ	3,872,356,533.65	3,854,219,110.82
මූල්‍ය වත්කම්		
අත්තිකාරම් ගිණුම්	23,718,117.51	29,726,981.61
මුදල් හා මුදල් සමාන දෑ	45.11	19,306.44
මුළු වත්කම්	3,896,074,696.27	3,883,965,398.87
ශුද්ධ වත්කම් / ස්කන්ධය		
ශුද්ධ වත්කම්	22,437,010.68	24,588,404.03
දේපළ පිරියත හා උපකරණ සංචිතය	3,872,356,533.65	3,854,219,110.82
ප්‍රංගම වගකීම්		
තැන්පතු ගිණුම්	1,281,106.83	5,138,577.58
අග්‍රිම ශේෂය	45.11	19,306.44
මුළු වගකීම්	3,896,074,696.27	3,883,965,398.87

පිටු අංක 4 සිට 28 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 29 සිට 39 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙලිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්ඩී ආර්එස්පී යූඑස්පී
එන්ඩීසී පීඑස්සී එම්සිල්
තනතුර : ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු
හා ආපදා කළමනාකරණ රාජ්‍ය
අමාත්‍යාංශය
දිනය : 2021.02. 17

.....
ගණන්දීමේ නිලධාරී
නම : ඒ.කේ.කරුණානායක
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2021.02. 12

ඒ.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
නම : ඩී.ඒ.එම්.එල්.තෙන්නකෝන්
දිනය : 2021.02. 12

අමිලා තෙන්නකෝන්
ගණකාධිකාරී
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07.

2

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්ඩී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්සිල්
ලේකම්
රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා
ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
ආදායම් නොවන ලැබීම්	20,703,444.29	30,339,005.42
අග්‍රිම ලැබීම්	307,508,525.00	296,037,876.92
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	328,211,969.29	326,376,882.34
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	298,646,243.72	296,697,660.73
සහනාධාර සහ මාරුකිරීම්	11,847,408.78	9,398,804.94
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	1,544,095.00	454,767.00
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	312,037,747.50	306,551,232.67
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	16,174,221.79	19,825,649.67
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
අත්තිකාරම් අයකර ගැනීම්	9,956,153.10	10,802,318.88
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	9,956,153.10	10,802,318.88
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	18,171,926.03	14,387,500.81
අත්තිකාරම් ගෙවීම්	4,100,933.00	11,423,706.00
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	22,272,859.03	25,811,206.81
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(12,316,705.93)	(15,008,887.93)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	3,857,515.86	4,816,761.74
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
කැන්පතු ලැබීම්	841,911.62	330,946,664.82
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	841,911.62	330,946,664.82
අඩුකළා : මුදල් වැය කිරීම්		
කැන්පතු ගෙවීම්	4,699,382.37	335,744,120.12
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	4,699,382.37	335,744,120.12
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	(3,857,470.75)	(4,797,455.30)
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	45.11	19,306.44
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	45.11	19,306.44

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

				රු. '000	
ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නොවේ					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

				රු. '000
ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණය % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	324,430.00	324,430.00	308,952.85	95%
ප්‍රාග්ධන	41,160.00	41,160.00	30,784.69	75%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

						රු. '000
අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
අදාල නොවේ						

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

					රු. '000
වත්කම් කේතය	**කේත විස්තරය**	**31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය**	**31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය**	**ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත**	**ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම**
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	278,325.00	278,325.00	-	-
9152	යන්ත්‍රෝපකරණ	313,994.30	313,994.30	-	-
9153	ඉඩම්	3,280,037.23	3,280,037.23	-	-
9154	අස්පෘෂ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්තාව අවසානයේ ඇමුණුමක් (ඇමුණුම 01) ලෙස අමුණා ඇත.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
1. ආපදා අවදානම අවම කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිසිකලට නිකුත් කිරීම	90%		
2. නිරීක්ෂණ ජාල වැඩි දියුණු කිරීම	95%		
3. මහජන කාලගුණ /දේශගුණ පිළිබඳ සේවාව ඉහළ නැංවීම	95%		
4. අනාවැකිකරණ වල නිරවද්‍යතාවය ඉහළ දැමීම	95%		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49 %	50 %-74 %	75% - 100 %
13. දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම	13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වාභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම.	13.1.1 ජනගහනයේ පුද්ගලයන් ලක්ෂයක් අතරින් හදිසි ආපදා හේතුවෙන් සිදුවන මරණ, අතුරුදන් වන සහ සෘජුව බලපෑමට ලක්වන පුද්ගලයන් සංඛ්‍යාව	20%		
		13.1.2 2015-2030 ආපදා අවදානම අවම කිරීම සඳහා වන සෙන්ඩායි කාර්ය රාමුවට අනුකූලව ජාතික අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව			
		13.1.3 ජාතික ආපදා අවම කිරීමේ ක්‍රමෝපායන්ට සමාන්තරව ප්‍රාදේශීය ආපදා අවම කිරීමේ ක්‍රමෝපායන් යොදාගෙන එය ක්‍රියාවට නංවා ඇති පළාත් පාලන කරන ආයතන ප්‍රමාණය			
	13.2 ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ සැලසුම්වලට	13.2.1 ආහාර නිෂ්පාදනයට තර්ජනයක් නොවන පරිදි (ජාතික හැඩගැසීමේ	20%		

	කාලගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම	සැලැස්මක්, ජාතික අධිෂ්ඨානශීලි දායකත්වය, ජාතික සංනිවේදනය සහ අර්ධ වාර්ෂික යාවත්කාලීන වාර්තා සහ සෙසු දේ) දේශගුණික වෙනස්වීමේ අහිතකර බලපෑම් සඳහා හැඩගැසීමට ඔවුන්ගේ හැකියාව වැඩිකරන ඒකාබද්ධ ප්‍රතිපත්ති/ ක්‍රමෝපාය/සැලසුම් සහ කාලගුණ වෙනස්වීම් හා හරිතාගාර වායු විමෝචනයක් අවම කිරීම් දියුණු කිරීම සඳහා වන කැපවීම පිළිබඳ අදහස් හුවමාරු කරගෙන, ස්ථාපනය කර සහ ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව			
	13.3 කාලගුණ වෙනස් වීම් අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම් අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම	13.3.1 ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අධ්‍යාපන විෂය මාලාවලට අවම කිරීම, හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව දැනුම්දීමේ ක්‍රම ඇතුළත්කර ඇති රටවල් සංඛ්‍යාව	20%		
		13.3.2 හැඩ ගැසීම, අවම කිරීම සහ තාක්ෂණික හුවමාරුව සඳහා වන ආයතනික පද්ධතිමය සහ පුද්ගලයන්ගේ ධාරිතා ගොඩනැංවීම සවිමත් කිරීම හා සංවර්ධනය සඳහා වන ක්‍රියාමාර්ග පිළිබඳ අදහස් සන්නිවේදනය සිදුකරගෙන ඇති රටවල් සංඛ්‍යාව			

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්

5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක

ඉලක්ක කාලගුණ විද්‍යා කටයුතුවලට අදාල බව සොයාගෙන ඇති අතර කාලගුණ විද්‍යාවට වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි හා කළ යුතු ඉලක්ක17 න් 11 ක්ම පවතී. (ඉලක්ක 1, 2, 3, 5, 6, 7, 9, 11, 13, 14, 15, 17) නමුත් සම්පූර්ණ අරමුණු සම්බන්ධයෙන් ගත් කල, මෙය "ඉලක්කය 13." පමණි. දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට කාලගුණ විද්‍යාව විසින් ඉටු කළ යුතු කාර්යභාරය ඉටු කිරීම සඳහා බොහෝ ය. එම ඉලක්ක සඳහා කාලගුණ විද්‍යාත්මක දායකත්වය වර්ගීකරණය කිරීමෙන් පසු වායු දූෂණය, දේශගුණික තොරතුරු, දේශගුණික විපර්යාස සහ කාලගුණ අනාවැකි ලෙස කොටස් හතරක් අර්ථ දක්වා ඇත:

ඉලක්කය 1: දුප්පත්කම අවසන් කරන්න.

ආපදා අවදානම අවම කිරීම, පර්යේෂණ ඉදිරියට ගෙනයාම සහ තීරණ ගැනීම සඳහා තොරතුරු හා සේවා සැපයීම පිළිබඳ සියලු කටයුතු පාහේ සංවර්ධනයට සහ දුප්පත්කම තුරන් කිරීමට දායක වේ. දරිද්‍රතාවය අවම කිරීමේ පියවර ලෙස සැමවිටම හඳුනා නොගත්තද, කාලගුණය, දේශගුණය ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන හා සේවාවන් අත්‍යවශ්‍ය හා බොහෝ විට මැනිය හැකි සමාජ-ආර්ථික ප්‍රතිලාභ ලබා දෙයි.

ඉලක්කය 2: කුසගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

ගොවීන්, සහ ධීවරයින් අවදානම් අඩු කිරීම, බෝග අනුගත කිරීම, එදිනෙදා හා සෘතුමය ගොවිජන කළමනාකරණය ඵලදායිතාව උපරිම කිරීම සඳහා කාලගුණ හා දේශගුණික සේවාවන් මත පුළුල් ලෙස රඳා සිටිති. කෘෂිකාර්මික අංශයට ඔවුන් වැඩි වැඩියෙන් ඉලක්ක කර ඇති සේවාවන් තුළින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ජාතික කාලගුණ විද්‍යා විද්‍යාත්මක සේවාවන් පැහැදිලිවම කේන්ද්‍රීය වේ. උදාහරණයක් ලෙස කාලගුණය, දේශගුණය සහ ගොවීන් පිළිබඳ රෝවිං සම්මන්ත්‍රණ ගොවීන්ට ඔවුන්ගේ මෙහෙයුම් තීරණ වලට ලබා ගත හැකි හොඳම කාලගුණය සහ දේශගුණික තොරතුරු යෙදවීමට සහාය වේ.

ඉලක්කය 3: නිරෝගී ජීවිත සහතික කිරීම සහ සෑම වයස් කාණ්ඩයකම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

ගංවතුර, නියඟ, උනුසුම්තාවය,සුළිසුළං සහ වායු දූෂණය හේතුවෙන් මරණ හා දේපළ හානි සිදුවෙයි. ජාතික කාලගුණ විද්‍යා සේවාව වෙනත් සේවා සපයන්නන්ට සෞඛ්‍ය ආයතනවලට සහ මහජනතාවට ලබා දෙන පුරෝකථනයන් සහ උපදෙස් මෙම ජීවිත බේරා ගැනීමට ඉවහල් වේ. බොහෝ රෝග බෝ කරන මදුරුවන්, කිනිතුල්ලන් සහ වෙනත් කෘමීන්ගේ පැවැත්ම සහ වර්ධනය කාලගුණය, දේශගුණය සහ ජලය යන සාධක මත නිරන්තරයෙන් බලපායි.

ඉලක්කය 5: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සියලුම කාන්තාවන් සවිබල ගැන්වීම

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමට සහ ගැහැණු ළමයින් හා කාන්තාවන් සවිබල ගැන්වීමට අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී. උසස් වීමේදී හෝ පුහුණු පාඨමාලා සඳහා තෝරා ගැනීමේදී කාන්තා සහ පිරිමි සියලු දෙනාටම සමව සලකයි. දේශගුණික විපර්යාස, ආපදා අවදානම අවම කිරීම සහ තිරසාර සංවර්ධනය යන අභියෝගයන්ට මුහුණ දීම ද සඳහා ඔවුන්ගේ හැකියාවන්, ශක්තිය සහ කුසලතා ඔප් නැංවීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී.

ඉලක්කය 6: සැමට ජලය සහ සනීපාරක්ෂාව ලබා ගත හැකි සහ තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම.

ඍතුමය, මාසික වැනි දිගු කාලීන අනාවැකි සැපයීමෙන් සහ දත්ත විශ්ලේෂණයන් සැපයීම මඟින් පානීය ජලය සුරක්ෂිත බව සහතික කිරීමට උපකාරී වේ. ජාතික කාලගුණ විද්‍යා තොරතුරු ජාලය මඟින් සපයනු ලබන වර්ෂාපතනය ඇතුලු අනෙක් නිරීක්ෂණ හා පර්යේෂණ තිරසාර ජල කළමනාකරණයට මග පෙන්වීම සඳහා අත්‍යවශ්‍ය වේ.

ඉලක්කය 7: සැමට දැරිය හැකි, විශ්වාසදායක, තිරසාර හා නවීන බලශක්තිය සඳහා ප්‍රවේශය සහතික කිරීම.

පිරිසිදු බලශක්ති ප්‍රභවයන් විසින් වෙළඳපල කොටසෙහි වර්ධනයට පහසුකම් සපයන්නේ වර්ෂාපතනය, හිරු එළිය සහ සුළං දත්ත සහ පුරෝකථනයන් මගිනි. කාලගුණ සහ දේශගුණ අනාවැකි ජල යටිතල පහසුකම් සහ බලශක්ති යටිතල පහසුකම් ආරක්ෂා කිරීමට උපකාරී වේ.

ඉලක්කය 9: ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම, සියල්ල ඇතුළත් සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නව්‍යකරණයන් පෝෂණය කිරීම.

දැඩි කාලගුණය නිසා අවදානමට ලක්විය හැකි යටිතල පහසුකම් වලට හානි කිරීමට හෝ විනාශ කිරීමට හැකි වන අතර එමඟින් ආර්ථික හා මානව පාඩු සිදුවිය හැකිය. ජාතික කාලගුණ වාර්තා සහ අනාවැකි, යටිතල පහසුකම් සහ කර්මාන්ත ස්වාභාවික උපද්‍රව වලින් ආරක්ෂා කරන අතර දේශගුණික විපර්යාසයන් වෙරළබඩ හා අනෙකුත් දේශගුණික අවදානමට ලක්විය හැකි ප්‍රදේශවල යටිතල පහසුකම් ස්ථානගත කිරීම සහ දේශගුණය පිළිබඳ මග පෙන්වීමක් සපයයි.

ඉලක්කය 11: නගර සහ මානව ජනාවාස සියල්ල ඇතුළත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර

කාලගුණික හා දේශගුණික තත්ත්වයන්ට වඩාත් හොඳින් ඔරොත්තු දීමට නගර සැලසුම්කරුවන්ට උදව් කිරීමෙන්, කාලගුණය සහ දේශගුණික උපද්‍රව වලින් සිදුවන මරණ හා දේපල හානිය අවම කිරීම, අවදානමට ලක් වූවන් සවිබල ගැන්වීම ආරක්ෂා කිරීමට බහු උපද්‍රව සහිත පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති (Multi Hazard Early warning system) සහ බලපෑම් මත පදනම් වූ අනතුරු ඇඟවීම් (Impact Based forecasts) හඳුන්වා දීම මඟින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව දායකත්වය දක්වයි.

ඉලක්කය 13: දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට හදිසි පියවර ගන්න.
තීරණ ගන්නන්ට දේශගුණික විපර්යාස බලපෑම් වලට අනුවර්තනය වීමට සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ අවශ්‍යතාවයන් සඳහා විද්‍යාත්මක කරුණු හා විශ්ලේෂණයන් ලබා දීම සිදු කරයි. දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමට සහාය දැක්වීමට සහ "ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන්" අනුව විමෝචන අවම කිරීමේ ක්‍රියාමාර්ගයන්ට මග පෙන්වීමට අවශ්‍ය දත්ත, පුරෝකථනයන් සහ පර්යේෂණ කටයුතු සඳහා සහයෝගය ලබා දෙන අතර කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ලංකාවේ "දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC)" නාභීය ලක්ෂ්‍යය (Focal point) ලෙස කටයුතු කරයි.

ඉලක්කය 14: තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සමුද්‍ර සම්පත් සංරක්ෂණය හා තිරසාර ලෙස භාවිතා කිරීම.
ලංකාව කුඩා දූපත් මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් අතරට ලා සැලකෙන අතර නිරන්තර කාලගුණික දේශගුණික වෙනස්කම් වලට තෝතැන්නක් වූ අවදානමට ලක්විය හැකි විශාල ඉන්දියන් සාගර යෙන් වටවූ රටක් මෙන්ම ලංකාවේ ජාතික ආර්ථිකයට සාගර, මුහුදු සහ සමුද්‍ර සම්පත් සැලකියයුතු මට්ටමකින් දායකත්වය දරයි. සාගර දිගින් දිගටම උණුසුම් වන අතර මුහුදු මට්ටම ඉහළ යන්ම සාගර සඳහා නිරීක්ෂණ, පර්යේෂණ හා මෙහෙයුම් සේවාවන්හි අවශ්‍යතාවය සඳහා පර්යේෂණ සඳහා දත්ත සහ අවශ්‍ය අනාවැකි ලබාදීම ජාතික කාලගුණ විද්‍යාත්මක සේවාව ලෙස තිබෙන අවම සම්පත් උපරිම ලෙස භවිතා කරමින් සහාය ලබාදේ.විශේෂයෙන් වෙරළබඩ ජලයෙන් යටවීමේ ගංගා ආශ්‍රිත ලවන තාවය වැඩිවීම වැනි දේවල් අවම කිරීමට මෙන්ම ඒවායින් වන හානිය වලක්වා ගැනීමට අවශ්‍ය තොරතුරු සහ පර්යේෂණ සඳහා අවශ්‍ය සහය ලබාදේ.

ඉලක්කය 15: භූමි පරිසර පද්ධතිවල තිරසාර භාවිතය ආරක්ෂා කිරීම, සහ ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසාරව කළමනාකරණය කිරීම, කාන්තාරීකරණයට එරෙහිව සටන් කිරීම සහ ඉඩම් හායනය වැළැක්වීම සහ ආපසු හැරවීම සහ ජෛව විවිධත්ව හානිය නැවැත්වීම.
නියඟය හා ගංවතුරෙන් හානියට පත් ඉඩම් ඇතුළුව, කාන්තාරීකරණයට එරෙහිව සටන් කිරීමට සහ පිරිහුණු ඉඩම් හා පස යථා තත්ත්වයට පත් කිරීමට ගන්නා උත්සාහයන්ට සහාය වන අත්‍යවශ්‍ය දත්ත සහ පුරෝකථනයන් සපයයි. ක්‍රියාශීලී හා ඒකාබද්ධ ජාතික නියඟ කළමනාකරණ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා රජයන්ට සහාය වීම සඳහා සහයෝගයෙන් කටයුතු කරයි

ඉලක්කය 17: ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය පුනර්ජීවනය කිරීම.
කාලගුණය, දේශගුණය සහ ජල සේවා සැපයීම සඳහා වූ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජාතික කාලගුණ විද්‍යා හා ජල විද්‍යාත්මක සේවාවන්හි හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධනය

ශක්තිමත් කිරීමයි. SDGs, ආපදා අවදානම් අවම කිරීම සඳහා සෙන්ඩායි රාමුව, 2015-2030, අනෙකුත් පාර්ශවකරුවන්ගේ හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

5.2.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

මෙම ඉලක්ක කරා යාමේදී වඩා විශ්වාසදායක කාලගුණ සහ දේශගුණ අනාවැකි සහ තොරතුරු සැපයීම අත්‍යවශ්‍ය කාරණයකි.

මේ සඳහා සමකය ආසන්න කුඩා දිවයිනක් මෙන්ම නැගෙනහිරින් විසල් ඉන්දියන් සාගරය සේම බටහිරින් අරාබි මුහුදින් වටවී ඇති ශ්‍රී ලංකාවේ කාලගුණ සහ දේශගුණ අනාවැකි කීමම අභියෝගයකි. එලෙසම අදාල සුදුසුකම් සහිත ප්‍රමාණවත් තරම් මානව සම්පත් හිඟයක් පැවතීම අනෙක් ප්‍රධාන අභියෝගය වේ. අවශ්‍ය තාක්ෂණික දැනුම විශේෂයෙන්ම ගණිතමය අනාවැකිකරණය වැඩිදියුණු කිරීම, නිලධාරීන්ට අවශ්‍ය දැනුම ලබාදීම සහ අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රමාණවත් තරමේ කාලගුණ දත්ත ලබා ගැනීමේ ජාලයක් සහ යථාවත් වූ සුපිරි පරිසණක පහසුකම් නොමැති වීමද අභියෝගයකි.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය (2020.12.31 දිනට කාර්ය මණ්ඩලය)

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	54	39	15
තෘතියික	29	4	25
ද්විතීයික	238	177	61
ප්‍රාථමික	139	124	15

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

ආයතනයේ මානව සම්පත් හිඟය දැඩි ලෙස කාර්ය සාධනයට බලපා ඇත. තාක්ෂණික නිලධාරීන්ගේ හිඟය වසර කිහිපයක සිට පවතී. මෙම නිලධාරීන් බඳවා ගනු ලබනුයේ තරඟ විභාගයකින් වන අතර සාමාන්‍යයෙන් වසර 02 ක පුහුණුවකින් පසු ප්‍රාදේශීය කාර්යාල වල සේවය සඳහා යොදා ගැනේ. පවතින දැඩි නිලධාරී හිඟය හේතුවෙන් වසර 02 යාමට මත්තෙන්ම ඔවුන් බාහිර කාර්යාල වලට යැවීමට සිදුව ඇත. සමහර මධ්‍යස්ථාන වල කාර්ය භාර නිලධාරී ලෙසද කනිෂ්ට නිලධාරීන් යෙදවීමට සිදුව ඇත. මෙවිට මෙම සේවාව තත්ත්වාකාරයෙන් පවත්වා ගැනීම ද අභියෝගයකි.

දෙපාර්තමේන්තුවේ කොඳුනාරටිය ලෙස සලකන කාලගුණ විද්‍යාඥයින් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම ද කාර්ය සාධනයට බලපෑම් ඇති කරයි. සේවා අවශ්‍යතාවයක් වන කාලගුණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ලබා ගැනීම සඳහා මෙරට තුළ හැකියාවක් නොමැති බැවින් කාලගුණ විද්‍යාඥයින් විදේශ ගත යුතු වන්නේය. එලෙස වසර 02 කට පමණ ඔවුන් විදේශ ගත වීමේදී එම පුරප්පාඩුව පිරවීම ද තරමක් ගැටලුවකි. ඇතිවෙමින් පවත්නා දේශගුණ වෙනස්වීම් හේතුවෙන් කාලගුණ සහ දේශගුණ තොරතුරු පිළිබඳ ඉමහත් ඉල්ලුමක් ඇතිවෙමින් පවතී. කෘෂිකාර්මික සහ ජල කළමණාකරණ කටයුතු සඳහා මෙම තොරතුරු සේවාදායකයනට අවශ්‍ය ආකාරයෙන් සැකසීමට සුදුසුකම් ලද නිලධාරීන් අත්‍යාවශ්‍ය සාධකයකි. සංවර්ධන, සංචාරක, බලශක්ති, ප්‍රවාහන, ගුවන්, නාවික කටයුතු සේම සෞඛ්‍ය වැනි සේවාවන් සඳහා ද අවශ්‍ය අනාවැකි සහ තොරතුරු සැපයීමට ද සැලකිය යුතු පිරිසක් අවශ්‍ය වේ. කාර්යාල සහායක හිඟය ද පවතී. ආයතනයේ පරිපාලන සහ මූල්‍ය අංශ සඳහාද ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීම හේතුවෙන් ඉතා අපහසුවෙන් රාජකාරි ඉටු කරමින් පවතී.

6 .3 මානව සම්පත් සංවර්ධනය

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	දින 10	රු.45		දේශීය	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම
Formal Letter Writing Skills පුහුණු වැඩසටහන	04	දින 03	රු. 72		දේශීය	රාජකාරී ලිපි ලිවීම පිලිබඳ මූලික දැනුම
Higher National Diploma in Public Procurement and Contract Administration	02		රු. 240		දේශීය	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම
ආයතන සංත්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	08	දින 02	-		දේශීය	ආයතන සංග්‍රහයේ විධිවිධාන

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ. /අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ				
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්	-		
2. පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)				
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3. මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභීනියෝජනය කිරීම (මු.රෙ.135)				
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුම්වත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ	අනුකූල වේ		

	ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම			
3.4	2014.05.11 දිනැති අංක171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4. වාර්ෂික සැලසුම් සකස් කිරීම				
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5. විගණන විමසුම්				
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,විගණන විමසුම වලට පිළිතුරු ලබාදීම	අනුකූල වේ		

6. අභ්‍යන්තර විගණනය				
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7. විගණන හා කළමනාකරණ කමිටු				
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට තීරණය කර ඇත	
8. වත්කම් කළමනාකරණය				
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ	අනුකූල නොවේ	අපහරණ භාණ්ඩ ලැයිස්තුව සකස්	ඉදිරියේදී මිලදී ගන්නා ලද

	07 වන පරිච්ඡේදය අනුව.වත්කම් මිල දී ගැනම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම		කරගැනීමේ ප්‍රමාද වීම් හේතුවෙන් භාණ්ඩ අපහරණ කටයුතු සිදුකර නොමැත	වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු නියමිත පරිදි කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ	ගර්හිත භාණ්ඩ අපහරණය සඳහා කටයුතු කරමින් පවතී	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ.772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	ගර්හිත භාණ්ඩ වෙන්දේසි කිරීම	

			සඳහා කටයුතු කරමින් පවතී	
9. වාහන කළමනාකරණය				
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශය වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලෝග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
9.4	වාහන ලෝග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	2020 වර්ෂයේ වාහන වල ඉන්ධන දහනය වීම පරීක්ෂා කිරීම කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කිරීමට නොහැකි විය	
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලෝග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලවේ		
10. බැංකු ගිණුම් කළමනාකරණය				

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	-		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11. ප්‍රතිපාදන උපයෝජනය				
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්				
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂකට වැඩ කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ	-		

	නිරිවුල් කර තිබීම			
13. පොදු තැන්පත් ගිණුම				
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14. අග්‍රිම ගිණුම				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15. ආදායම් ගිණුම				
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු	අනුකූල වේ		

	ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16. මානව සම්පත් කළමනාකරණය				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකාවන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17. මහජනයා වෙත තොරතුරු ලබාදීම				
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ	අනුකූල වේ		

	ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සපයා දී තිබීම			
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම				
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	සම්පාදනය කරමින් පවතී		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂනය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කිරීම	අනුකූල නොවේ		ක්‍රමවේදයක් සකස් කරමින් පවතී
19. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් නිසි දැනුවත්භාවයක් නොමැති වීම	ඒ සඳහා පුහුණුවක් ලබාගැනීමට ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ආපදා කළමණාකරණ

				අංශයෙන් ඉල්ලීම් කර ඇත
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		2020 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට නියමිතය
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙළ කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම	අනුකූල වේ		
20 විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණල ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. DMG/A/MET/FS/2020/09 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 ජූනි 29 දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාවේ මේ සමග එවා ඇත.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
0 8 JUL 2021
ලියාපදිංචි අංශය

ජී. තේවඥානන්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :-
01. ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරන රාජ්‍ය අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொலுதுவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. DMG/A/MET/FS/2020/09 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 ජූනි දින

අධ්‍යක්ෂ ජනරාල්

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව දින නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තීරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනිම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ 1.6.2.1 (ඇ) ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අනුරූප වන බවට මට ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

1.6.1.1 අත්තිකාරම් ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1999 හා 2010 වර්ෂයේ සේවය හැරගිය සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙලින් රු.14,092 ක්, රු.121,830 ක් සහ විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.54,868 ක ණය ශේෂය 2020 මාර්තු 16 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු ආපදා හා උත්සව අත්තිකාරම් ණය ශේෂ එකතුව අත්තිකාරම් ලේඛණය අනුව රු.191,548 ක් වුවද ගිණුම් අනුව රු.121,548 ක් වූ බැවින් රු.70,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් ගොන්ගල ඩොප්ලර් රේඩාර් පද්ධතිය ස්ථාපනය කිරීම වෙනුවෙන් 2007 වර්ෂයේ සිට රු.402,825,422 ක පිරිවැයක් දරා තිබුණ ද අදාල කාර්යය ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. ලෝක කාලගුණ විද්‍යා සංගමයේ

භාරකාර අරමුදලේ පැවති රු.322,926,702 ක මුදල 2019 දෙසැම්බර් මස නැවත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට ගෙන්වාගෙන නිබුණ අතර ඉන් රු.1,000,000 ක මුදලක් අත රඳවාගෙන ඉතිරිය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නිබුණි. රු.9,146,765 ක් වටිනා උපකරණ 2016 ජනවාරි මාසයේදී නැතිවී නිබුණු අතර මේ පිළිබඳ කිසිදු සටහනක් මුල්‍ය ප්‍රකාශන මගින් හෙලිදරව් කර නොතිබුණි.

(ආ) ඉදිරිපත් කර ඇති මුල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2020 ජනවාරි 01 දිනට ශේෂය 2019 ජනවාරි 01 ශේෂය ලෙසද 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය 2019 දෙසැම්බර් 31දිනට ශේෂය ලෙසද දක්වා නිබුණි.

(ඇ) මුල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් වෙනත් යන්ත්‍ර හා උපකරණ වර්ග 05 ක 2020 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන එන ලද ශේෂය රු.534,482,682 වුවද 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.264,733, 764 ලෙස දක්වා නිබිමෙන් ඉකුත් වර්ෂ අවසාන දිනට ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර රු.5,015,190 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මුල්‍ය ප්‍රකාශයේ නැවත ජනනය නොවන වත්කම් ලෙස ඉඩම් යටතේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.2,261,299 වුවත් සමාලෝචිත වර්ෂයේ 2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂ ලෙස රු.3,276,261,299 ලෙස දක්වා නිබිමෙන් රු.3,274,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි .

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කල හැකිවන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය.	පවත්වා නොතිබුණි.

(ආ) අත්තිකාරම් ලේඛනය — සී.සී 10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුය. — උත්සව අත්තිකාරම්,විශේෂ හා ගං වතුර අත්තිකාරම් ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනය — අංක 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගත යුතුය. — යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

1.6.4 මුදල් ප්‍රවාහ **ප්‍රකාශය**

දෙපාර්තමේන්තුවේ පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු.10,876,363 ක් ද අත්තිකාරම් ගෙවීම් රු.5,012,143 ක් වුවද මුදල් ප්‍රවාහයේ එය පිළිවෙලින් රු.9,956,153 ක් හා රු. 4,100,933 ක් ලෙස දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු.365,590,000 වූ අතර උපයෝජනය රු.339,737,540 බැවින් රු.25,852,460 හෙවත් සියයට 7.08 ක ප්‍රතිපාදනය උපයෝජනය කර නොතිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයන් 05 ක සියයට 21 සිට සියයට 51 ක පරාසයක ද, ප්‍රාග්ධන වැය විෂයන් 05 ක සියයට 35 සිට සියයට 89 ක පරාසයක ද, ඉතිරිවීම් නිරීක්ෂණය විය.

2.2 බැරකම් හා බැඳීම්වලට එලඹීම

දෙපාර්තමේන්තු පොත් අනුව වැය විෂයයන් 07 ක බැරකම් එකතුව රු.1,199,611 ක් සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 571	අවුරුදු 2 ක් ඉක්ම වූ තැන්පතු රු249,219 ක් අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැරකිරීමට කටයුතු කර නොතිබුණි.
ii. මුදල් රෙගුලාසි 1646	මුදල් රෙගුලාසිය ප්‍රකාරව ධාවන සටහන් හා මාසික සාරාංශ ඊලඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 වර්ෂයේ සිට වාහන 07 මාසික සාරාංශ ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.4.3 වගන්තිය	වාහන අළුත්වැඩියා කිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචිකර නොතිබුණි.
(ඇ) 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 28 ආ (2) (ආ) හි 8 (ඒ) (i) වගන්තිය	යම් නීතියක විධිවිධාන කෙසේ සඳහන් වුවද යම් සංවර්ධන ප්‍රදේශයක හෝ එහි කොටසක යම් සංවර්ධන කටයුතු කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරත වීම, ආණ්ඩුවේ නියෝජ්‍යායතනයක් ඇතුළු කිසිම තැනැත්තෙකු

විසින් අධිකාරිය විසින් එහිලා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ හැර, කරනු නොලැබිය යුතු වුවද දෙපාර්තමේන්තුවේ ඉදිරිපස වැට ඉදිකිරීම සඳහා එවැනි අවසර පත්‍රයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.තවද මෙම ඉඩම අධිකාරිය සතු කරගතහොත් කිසිදු වන්දියක් ලැබීමට දෙපාර්තමේන්තුවට හිමිකමක් නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) 2016 දෙසැම්බර් 26 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

i. 3.1 ඡේදය — සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුව සතු වාහන 09 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.

ii. 4.4 ඡේදය — කොළඹ නගර සීමාවේ තිබෙන වාහන අළුත්වැඩියාව සම්බන්ධයෙන් එම නගර සීමාවේ තිබෙන ගරාජවලින් මිල ගණන් කැඳවිය යුතු වුවද එම නගර සීමාවන් පිටත පිහිටි ආයතනයන් තෝරාගන අළුත්වැඩියා කටයුතු සිදුකර තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 396 — 2020 දෙසැම්බර් 30 දිනට නිකුත් කර මාස 06 ඉක්ම වූ එකතු වටිනාකම රු.41,212 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

අවස්ථා 13 කදී අත්තිකාරම් වියදම් සියයට 20.19 ක සිට සියයට 283.14 ක පරාසයක් අවශ්‍යතාවය ඉක්මවා ලබා ගැනිම, අත්තිකාරම් කාර්යය නිම වූ විගස පියවිය යුතු වුවද අවස්ථා 07 කදී මාස 1 සිට මාස 11 ක ප්‍රමාදයක් සහිතව පියවීම, අවස්ථා 06 ක දී ලබා ගත් අත්තිකාරම් මුදල ඉක්මවා වියදම් කළ අවස්ථා ද නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

3.1.1 කාර්යය භාරයන් ඉටු නොකිරීම

ක්‍රියාකාරී සැලැස්ම අනුව සිදුකළ කාර්යයන් 07 න් කාර්යයන් 03 ක ප්‍රගතිය සියයට 60 ක පහල අගයක් ගෙන තිබුණි. හැකියා වර්ධනය වෙනුවෙන් කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා වෙන් කළ රු.මිලියන 1.37 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 0.63 ක් හෙවත් සියයට 5 පමණක් වැයකර තිබුණි. ඩොප්ලර් කාලගුණ රේඩාර් පද්ධතියේ මූල්‍ය ප්‍රගතිය සියයට සියයක් වුවද භෞතික ප්‍රගතිය සියයට 16 පමණක් විය. අකුණු හඳුනාගැනීමේ පද්ධතිය වෙනුවෙන් (lightning detection system) රු.මිලියන 2.20 අයවැය ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද වැය කර තිබූ තත්‍ය මුදල් ප්‍රමාණය රු.මිලියන 0.25 ක් හෙවත් සියයට 11.36 ක් විය.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉදිරිපස වැට හා ගේට්ටුව ඉදිකිරීමේ අවසන් බිල්පත සඳහා රු.3,277,459 ගෙවා තිබුණ අතර එම බිල් පත්‍රය හා යෙදූ යකඩවල ගුණාත්මකත්වය පිළිබඳව සිවිල් ඉංජිනේරුවරයෙකු හෝ කාර්මික නිලධාරියෙකුගේ සහතිකයක් නොවුණි. ලංසු පිළිබඳ රැස්වීම අනුව වැටෙහි අත්තිවාරම් කොටස බැඳි ගලෙන් නිම කළ යුතු වුවත් එසේ නොමැතිව කපරාරු කර තිබුණි. භෞතික පරීක්ෂාවේදී අත්තිවාරමේ ඉරි තැලීම් ස්ථාන 37 ක්, මලකඩ කැම් හා ගේට්ටු කනු ක්‍රමවත්ව නිමකර නොතිබුණු අතර නිසි පරිදි පැස්සුම් නොකිරීම නිසා වතුර රැඳීම් හා ගල්වන ලද තින්ත කොටස් ගැලවී යාම් වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.

3.2 ප්‍රසම්පාදනයන්

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (ඇ) පරිදි 2020 වර්ෂ සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ වාහනයක් අළුත්වැඩියා කරන ලෙස ඉල්ලා තිබුණ ද 2021 පෙබරවාරි 11 දින දක්වාම වාහනය අලුත්වැඩියා නොකර නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) වාහනයක් 2020 මැයි 15 හා 17 යන දිනවල අනතුරුවලට ලක් වී තිබුණි. පළමු අවස්ථාවේ අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබාගත් ගමන් මාර්ගයක ගමන් කර නොතිබූ අතර දෙවන අවස්ථාවේ අධ්‍යක්ෂකගේ අනුමැතියකින් තොරව ධාවනය කර තිබුණි. මෙම අනතුර සම්බන්ධ විමර්ශනයක් පවත්වා 2020 ජූලි 18 දින වාර්තාවක් ලබා දී තිබුණද විධිමත් පරීක්ෂණ කටයුතු 2021 අප්‍රේල් වන විටත් සිදු කර අවසන් කර නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) දිවයිනට බලපාන වැසි තත්ත්වය හා අනුබද්ධ කාලගුණ තත්ත්ව වඩාත් හොඳින් නිරීක්ෂණය කිරීමට සහ අයහපත් කාලගුණය පිළිබඳ පූර්ව අනතුරු ලබාදීමේ ක්‍රමවේදයට පිටුවහලක් ලබා ගැනීමේ අරමුණින් ඩොප්ලර් රේඩාර් පද්ධතියක් පුන්තලම හා පොතුවිල් කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල පිහිටුවීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය විසින් ජපන් යෙන් 2,503,000,000 ක ප්‍රදානයක් ලබා දීම සඳහා 2017 ජුනි 30 දින ශ්‍රී ලංකා රජය අතර ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය මගින් රු.486,650,000 ක මුදලක්ද දැරිය යුතු වන අතර ව්‍යාපෘති වැඩ දියුණු කිරීමේ කාලය 2017-2021 දක්වා විය. 2017 වර්ෂයේ සිට දැනට වර්ෂ 04 ක කාලයක් ගත වී තිබුණ ද මෙතෙක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මෙලෙස නියමිත කාලය තුල අදාල කටයුතු සිදු නොවීම හේතුවෙන් ඉදිරියේදී අමතර වියදමක්ද අමතර කාලයක් ද ඒ සඳහා දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය. එමෙන්ම පොතුවිල් රේඩාර් කුළුණු ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය පිහිටි භූමියද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට පවරා නොතිබුණි.

(ආ) මිනවාටා සම්මුතිය ප්‍රකාරව 2020 වර්ෂයෙන් පසු රසදිය අඩංගු නිෂ්පාදන ආනයනය හෝ අපනයනය නොකල යුතු බව දක්වා තිබුණ ද විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2020 ජූලි 22 වන විටත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යාල 23 ක රසදිය උපකරණ 139 ක් ද දෙපාර්තමේන්තුවට සහාය වන පිටස්තර මධ්‍යස්ථාන 33 ක රසදිය උපකරණ 264 ක් ද භාවිතා වන බව නිරීක්ෂණය විය.

රසදිය අඩංගු නිෂ්පාදන ආනයනය 2020 වන විට නතර වුවද ගෙන්වා ඇති උපකරණ භාවිතය සඳහා එය බාධාවක් නොවන අතර රසදිය අඩංගු උපකරණ භාවිතයෙන් ඉවත් කිරීම සඳහා දිනයක් නිශ්චය කර නොමැති බව අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා තිබුණි.

4 තිරසර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර තිරසර සංවර්ධන උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම දෙපාර්තමේන්තුව විසින් සකසා අවසන් කිරීම හා දත්ත ගබඩා කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. තවද තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලහා වීමේ ප්‍රගතිය වාර්තා කර නොතිබුණි .

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනක තනතුර 2013 වර්ෂයේ සිට 2019 ජූලි 01 දින දක්වා එම තනතුර පුරප්පාඩුව පැවතුණි. තනතුරට පත් කරන ලද නිලධාරිනිය 2020 අප්‍රේල් 17 දින ස්ථාන මාරු වී තිබුණ ද විගණන දිනය වූ 2021 අප්‍රේල් දක්වාම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩල 460 ක් වුවද සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 343 ක් වූ බැවින් කාර්යය මණ්ඩල පුරප්පාඩු 117 ක් විය. අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ කාලගුණ විද්‍යා නිලධාරීන් 03 දෙනෙකු සේවයේ නියුතුව සිටි.තවද, දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් සැලැස්මක් සකසා නොතිබුණි.

ජී.තේවඥානන්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට